සැ. යු.-2012.11.30 දින පළ වූ අංක 1,787 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,788 - 2012 දෙසැම්බර් මස 07 වැනි සිකුරාදා - 2012.12.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1873 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |

*සැ. යු.-* චම්පික ප්‍රේමදාස ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2012 නොවැම්බර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

මිස්ටිකල් රෝස් ජාත්‍යන්තර ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2012 නොවැම්බර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 දෙසැම්බර් මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 දෙසැම්බර් මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*)

2012 ජූනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

1871 - B 80670—8,920 (2012/12)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# තනතුරු - ඇබෑර්තු

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### තාවකාලික වැඩ බලන රජයේ අධිනීතිඥ තනතුර (නීතිපති දෙපාර්තමේන්තුව)

01. බඳවා ගැනීමේ ක්‍රමවේදය ඃ

මෙම තනතුරට සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් එම කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ලබා දෙන නිර්දේශ මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් අදාළ ක්‍ෂෙත්‍රයේ ලබා ඇති සුදුසුකම්, කාර්ය සාධනය, පළපුරුද්ද හා හැකියාවන් සලකා බලා සුදුසු අයදුම්කරුවන් තෝරාගනු ලැබේ.

02. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් ඃ ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු විය යුතු ය.

03. වැටුප ඃ රු. 28,095 (මාසික)

04. *සේවා නියුක්ත කිරීමේ කොන්දේසි.*-මෙම තනතුර රජයේ ස්ථිර පත්වීමක් නොවන අතර, විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් නොමැත.

05. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *කරුණ* | *උපරිම ලකුණු* | *විස්තරය* | *ලකුණු* |
|---|---|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | ලකුණු 20 (උපරිම සුදුසුකම පමණක් සළකා බලනු ලැබේ.) | i. පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන පශ්චාත් නීතිවේදී උපාධිය (LLM) | ලකුණු 20 |
| | | ii. ශ්‍රී ලංකා නීති විද්‍යාලය මගින් හෝ සංස්ථාපිත නීති අධ්‍යාපන සභාව මගින් පිරිනමන පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමාවක් | ලකුණු 16 |
| | | iii. පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) පළමු පෙළ සාමාර්ථය | ලකුණු 15 |
| | | iv. පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) දෙවන පෙළ ඉහළ සාමාර්ථය | ලකුණු 10 |
| | | v. පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) දෙවන පෙළ පහළ සාමාර්ථය | ලකුණු 08 |
| | | vi. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය පළමු පෙළ සාමාර්ථය | ලකුණු 10 |
| | | vii. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය දෙවන පෙළ සාමාර්ථය | ලකුණු 08 |
| පළපුරුද්ද | ලකුණු 30 | එක් අවුරුද්දක් සඳහා ලකුණු 05 බැගින්ද, (අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ ජනාධිපති නීතිඥවරයෙකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.) | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය (සිද්ධි අධ්‍යයනයක් මගින් ඉදිරිපත් කිරීම) | ලකුණු 40 | තර්ක කිරීමේ හැකියාව | ලකුණු 08 |
| | | කථනය | ලකුණු 08 |
| | | ප්‍රතිචාර දැක්වීමේ හැකියාව | ලකුණු 08 |
| | | සේවා හැකියාව | ලකුණු 08 |
| | | ඉදිරිපත් කිරීමේ හැකියාව | ලකුණු 08 |
| විශේෂ දක්‍ෂතා | ලකුණු 10 | මූට්වරයෙකු ලෙස (Mooter) ලබා ඇති ස්ථානය (නීති පීඨයේ පීඨාධිපති විසින් හෝ නීති විද්‍යාලයේ විදුහල්පති විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.) | ලකුණු 05 |
| | | ජූරිය ඇමතීම (නීති පීඨයේ පීඨාධිපති විසින් හෝ නීති විද්‍යාලයේ විදුහල්පති විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.) — පළමු ත්‍යාගය | ලකුණු 05 |
| | | දෙවන ත්‍යාගය | ලකුණු 04 |
| | | තෙවන ත්‍යාගය | ලකුණු 03 |

06. අයදුම් කිරීමේ ක්‍රමය :

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත්‍ර කොළඹ 12, නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යාලයෙන් ලබාගත යුතු අතර, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2012 දෙසැම්බර් මස 31 වැනි දින අ. භා. 3.00ට පෙර ලියාපදිංචි තැපෑලෙන් ගරු නීතිපති, නීතිපති දෙපාර්තමේන්තුව, කොළඹ 12 යන ලිපිනයට යොමු කළ යුතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

ලේකම්,
ජනාධිපති කාර්යාලය.

2012 නොවැම්බර් මස 21 වැනි දින.

12-174

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 - I ශ්‍රේණියේ පුරප්පාඩු

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති අධ්‍යාපන විද්‍යාපීඨ සහ ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-I ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා අධ්‍යාපන ලේකම් විසින් අයදුම්පත් භාරගනු ලැබේ.

2.0 මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, 2012.12.26 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ 'ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-I ශ්‍රේණියේ පුරප්පාඩු' යනුවෙන් හා තමා අයදුම්කරන තනතුර හා විද්‍යාපීඨය හෝ ගුරු විද්‍යාලය සඳහන් කළ යුතුය. සියළුම අයදුම්කරුවන් විසින් අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.0 *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි*

3.1 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 12.1 හා 12.6 සිට 12.12 දක්වා වගන්ති අදාල වේ.

3.2 නේවාසික පහසුකම් සලසා ඇති විට අධ්‍යාපන විද්‍යාපීඨ සීමාව තුළ පදිංචි විය යුතුය.

3.3 තනතුරු සඳහා තෝරාගනු ලබන අපේක්ෂක අපේක්ෂිකාවන් සේවා අවශ්‍යතා අනුව කුමන අධ්‍යාපන විද්‍යා පීඨයක හෝ ගුරු විද්‍යාලයක වුවද සේවය කිරීමට බැඳී සිටී.

3.4 මෙම *ගැසට් පත්‍රයේ* I කොටසේ දක්වා ඇති රාජ්‍ය සේවා තනතුරු සඳහා පත්කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

4.0 *සාමාන්‍ය සුදුසුකම්.*

4.1 ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවේ 17 වැනි වගන්තිය අනුව උපාධිය ලබා ඇත්තේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් නොවේ නම් උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබීම පිණිස අ. පො. ස. (සා. පෙළ) හෝ සමාන විභාගයකදී ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ එයට උසස් සහතිකයක් ලබා තිබීම අවශ්‍යතාවක් වනු ඇත.

5.0 අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්

ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-1 ශ්‍රේණිය

5.1 ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වැනි පන්තියේ II වැනි ශ්‍රේණිය යටතේ උපලේඛනගත තනතුරක පස් වසරකට නොඅඩු සතුටුදායක සේවයක් සම්පූර්ණකර සේවයේ ස්ථිර කර තිබීම හා ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-II ශ්‍රේණියට අයත් කාර්යක්ෂමතා කඩඉම සමත්වී තිබීම.

හා

5.2 අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ උපාධි හෝ ඩිප්ලෝමාවක් සහිතව පහත සඳහන් ශාස්ත්‍රීය හා වෘත්තීය සුදුසුකම් සම්පූර්ණකර තිබීම.

5.3.1 පිළිගත් විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපනය පිළිබඳ පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ (ඉහළ) උපාධියක් ලබා තිබීම හෝ අධ්‍යාපනය පිළිබඳ ඉහළ උපාධියක් ලබා තිබීම;

හෝ

5.3.2 පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක් ලබා තිබීම සහ විශිෂ්ඨ හෝ සම්මාන සමාර්ථයක් සහිතව පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදාළ විෂය ක්ෂේත්‍රයෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම;

හෝ

5.3.3 පිළිගත් විශ්වවිද්‍යාලයකින් පළමු හෝ දෙවන පංතියේ (ඉහළ) සාමාර්ථයක් සහිතව උපාධියක් හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදාළ විෂය ක්‍ෂෙත්‍රයෙන් හෝ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

*සැ. ක. යු.* : නියමිත දිනට (1995.01.01) අධ්‍යාපන විද්‍යාපීඨයක ස්ථිර කථිකාචාර්යවරයෙක් වශයෙන් හෝ සහාය කථිකාචාර්යවරයෙකු වශයෙන් හෝ වසර පහකට (05) නොඅඩු සේවා කාලයක් සම්පූර්ණකර ඇති වයස අවු. 45 ඉක්මවා සිටින අය ඉහත 5.1.2 ඡේදයේ අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ උපාධියක් හෝ ඩිප්ලෝමාවක් තිබීමේ අවශ්‍යතාවයෙන් පමණක් නිදහස් කරනු ලැබේ.

6.0. *වැටුප් පරිමාණය* :

6.1 වැටුප් පරිමාණය : SL 1-2006

7.0 තෝරා ගැනීමේ ක්‍රමය :

7.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් එම කොමිෂන් සභාව මගින් අනුමත කරනු ලැබූ ලකුණු පරිපාටියකට අනුව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරාගනු ලැබේ.

7.2 සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ පහත සඳහන් ලිපිලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

7.2.1 උප්පැන්න සහතිකය (උපකෘත පාසල්වලට ඇතුළත් කිරීමේ නීති යටතේ නිකුත් කර ඇති උප්පැන්න සහතික හෝ බෞතීස්ම සහතිකය හෝ පිළිගනු නොලැබේ.);
7.2.2. උපාධි සහතික සහ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ වෙනත් සහතික;
7.2.3. වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික;
7.2.4 සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා දැනුම පිළිබඳව ලබා ඇති උසස්ම සහතික.

7.3 පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් සංඛ්‍යාවක් පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.
7.4 2-1 ශ්‍රේණියට සුදුසුකම් ලැබීමට පූර්වාසන්න පස් (05) අවුරුදු කාලය තුළ දඬුවමකට භාජනය නොවීමෙන් හා වැටුප් වර්ධක උපයා ගැනීමෙන් සතුටුදායක සේවයක් සම්පූර්ණකර තිබිය යුතුයි.
7.5 සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අවශ්‍ය ලිපිලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයගේ අයදුම්පත් ගැන සළකා බලනු නොලැබේ.
7.6 *ගැසට් නිවේදනයේ* අංක 04 සහ අංක 05 යටතේ සුදුසුකම් සනාථ කිරීමේ සහතිකවල සහ උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතු ය.

8.0 එක් විද්‍යාපීඨයකට හෝ එක් ගුරු විදුහලකට වඩා ඉල්ලුම් කරන්නේ නම් ඒ සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එස්. එම්. ගෝඨාභය ජයරත්න,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-1 ශ්‍රේණියේ පුරප්පාඩු**

*ආදර්ශ අයදුම්පත්‍රය*

(A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කරගත යුතුය. එක් විද්‍යාපීඨයකට හෝ එක් ගුරු විදුහලකට වඩා ඉල්ලුම් කරන්නේ නම් ඒ සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය)

01 (i) ඉල්ලුම්කරන තනතුර :————.
(ii) අදාළ විද්‍යාපීඨය :————.
(iii) මාධ්‍යය :————.
(iv) 2-1 ශ්‍රේණියට අයදුම් කිරීම සඳහා ගැසට් නිවේදනයේ 5.0 යටතේ සුදුසුකම් ලබන නිර්ණායක අංකය:————.

02. (i) මුලකුරු සමග නම (සිංහලෙන්) :————. හිමි/මයා./මිය./මෙය.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) Rev./Mr./Mrs./Miss :————.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

03. (i) රාජකාරි ලිපිනය :————.
(ii) පෞද්ගලික ලිපිනය :————.
(iii) පෞද්ගලික දුරකථන අංකය :————.

04. (i) උපන් දිනය :————.
(ii) ජාතික හැඳුනුම්පත් අංකය :————.

05. පුරවැසිභාවය :————.
(i) පරම්පරාවෙන්ද/ලියාපදිංචි කිරීමෙන් ද යන වග :————.

06. ඔබ අයත් ජන වර්ගය : [ ] (ඉලක්කමෙන්)

(1. සිංහල 2. දෙමළ 3. වෙනත්)

07. (i) මුල් පත්වීමේ දිනය හා තනතුර :————.
(ii) වර්තමාන තනතුර හා එයට පත් වූ දිනය :————.
(iii) වර්තමාන සේවා ස්ථානය :————.
(iv) ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-11 ශ්‍රේණියේ කාර්‍යක්ෂමතා කඩඉම සමත්/අසමත් යන්න හා සමත්නම් ප්‍රතිඵල වලංගු දිනය :————.

08. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර ඃ

(i) පළමු උපාධිය ඃ

| *උපාධියේ නම හා නිකුත් කළ ආයතනය* | *වර්ෂය* | *පන්තිය* | *විෂයයන්* |
|---|---|---|---|
| | | | |

(ii) පශ්චාත් උපාධිය

| *සහතිකයේ නම සහ නිකුත් කළ ආයතනය* | *වර්ෂය* | *පන්තිය* | *විශිෂ්ඨ/සම්මාන/සාමාන්‍ය ද යන වග* |
|---|---|---|---|
| | | | |

(iii) අධ්‍යාපන ඩිප්ලෝමාව :

| සහතිකයේ නම සහ නිකුත් කළ ආයතනය | පාඨමාලාවට ගත වූ කාලය | විශිෂ්ඨ ද සම්මාන ද යන වග | විෂයයන් පිළිබඳ විස්තර |
|---|---|---|---|
| | | | |

(iv) වෙනත් වෘත්තීය සුදුසුකම් (ඩිප්ලෝමා සහතික හා පුහුණු ගුරු සහතික පිළිබඳ විස්තර) :

| සහතිකයේ නම සහ නිකුත් කළ ආයතනය | පාඨමාලාවට ගත වූ කාලය | විෂයයන් පිළිබඳ විස්තර |
|---|---|---|
| | | |

(v) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීනතාව

| අ. පො. ස. (සා/පෙළ) | සාමාන්‍ය/සම්මාන/අධිසම්මාන | ප්‍රතිඵල වලංගු දිනය |
|---|---|---|
| | | |

| ඉංග්‍රීසි විෂයට අදාළව ලබා ඇති වෙනත් සහතික | නිකුත් කළ ආයතනය හා වලංගු දිනය | ශ්‍රේණිය |
|---|---|---|
| | | |

09. කිසියම් වරදකට උසාවියකදී ඔබ වරදකරුවෙකු වශයෙන් තීරණයකර තිබේද? (එසේ නම් විස්තර සඳහන් කරන්න.) :————.

10. දැනට ඔබට විරුද්ධව දෙපාර්තමේන්තුමය, විනයානුකූල පරීක්ෂණයක් පවත්වන්නේද? නැතහොත් අධිකරණය ඉදිරියේ නඩුවක් විභාග වෙමින් පවතී ද? (එසේ නම් විස්තර සඳහන් කරන්න.) :————.

11. මෙම ඉල්ලුම් පතෙහි මා විසින් සඳහන් කර ඇති සියලුම තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි දී ඇති තොරතුරු කිසිවක් අසත්‍ය හෝ සාවද්‍ය බව අනාවරණය වුවහොත් ඒ මත මා මෙම තනතුර ලැබීමට නුසුදුස්සකු බවට තීරණය කරන බවත්, උසස්වීම ලැබීමෙන් පසු මෙහි සඳහන් තොරතුරු කිසිවක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව අනාවරණය වුවහොත් මා කිසිම වන්දියක් නොලබා තනතුරින් පහකිරීමට යටත් වන බව ද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

...................................ගේ ඉල්ලුම්පත ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම ආයතනයේ ........................වශයෙන් සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් හිමි/ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
ආයතන ප්‍රධානියා හෝ එම ප්‍රධානියා වෙනුවට
බලය ලබා ඇති නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.
ආයතනය :————.

## ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 - II ශ්‍රේණියේ නිලධාරීන් 2-I ශ්‍රේණියට උසස් කිරීමේ ලකුණු පරිපාටිය

ලකුණු ලබාදීම සඳහා අදාළ සුදුසුකම් පුරප්පාඩුව ඇති වූ දිනට පෙර සපුරා තිබිය යුතුය.

| | | |
|---|---|---|
| 1.0 | සේවා පළපුරුද්ද<br>ශ්‍රී. ලං. ගු. අ. සේ. 2-II ශ්‍රේණියේ වසර 05ට වැඩි අමතර සක්‍රීය සේවා කාලය සඳහා එක් වසරකට ලකුණු 10 බැගින් උපරිම වසර 05ක් සඳහා ලබා දෙනු ලැබේ. | උපරිම ලකුණු 50 |
| 2.0 | අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-I ට ඉල්ලුම් කිරීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ඇති සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | උපරිම ලකුණු 20 |
| | 2.1 උපාධිය | 05 |
| | 2.2 පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 10 |
| | 2.3 පශ්චාත් උපාධිය | 15 |
| | 2.4 ආචාර්ය උපාධිය | 20 |
| 03. | ශාස්ත්‍රීය කාර්ය සාධනය<br>උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ පශ්චාත් උපාධියට ඉදිරිපත් කරන ලද ලේඛන සඳහා ලකුණු ලබාදෙනු නොලැබෙන අතර එක් ප්‍රකාශනයක් සහ එක් පර්යේෂණයක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | උපරිම ලකුණු 10 |
| | 3.1 පර්යේෂණ | |
| | 3.1.1 විධිමත්ව සැකසූ පර්යේෂණ වාර්තාව (අවසන් වාර්තාව) | 02 |
| | 3.1.2 රැකියා ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණයක් වීම | 01 |
| | 3.1.3 ප්‍රසිද්ධ පර්යේෂණ සාකච්ඡා මණ්ඩපයකට ඉදිරිපත් කර තිබීම | 02 |
| | 3.2 ප්‍රකාශන | |
| | 3.2.1 විෂයානුබද්ධ ප්‍රකාශන (පුවත්පත්, වාර සඟරා ආදියේ ප්‍රසිද්ධියට පත් කළ) | 03 |
| | 3.2.2. විෂයානුබද්ධ පොත් පළ කිරීම | 02 |
| 04. | තොරතුරු තාක්ෂණ හැකියාව<br>(රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් සහතික සඳහා පමණක් ලකුණු හිමි වේ.) | උපරිම ලකුණු 10 |
| | 4.1 මාස 06ට හෝ ඊට වැඩි තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා | 05 |
| | 4.2 වසර 01ක් හෝ වසර 1ට වැඩි තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා සඳහා | 10 |
| 05. | භාෂා දැනුම<br>(රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් සහතික සඳහා පමණක් ලකුණු හිමි වේ.)<br>ඉංග්‍රීසි භාෂාව | උපරිම ලකුණු 10 |
| | 5.1 මාස 06ක් හෝ ඊට වැඩි කාලයක ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක් සඳහා | 05 |
| | 5.2 වසර 01 හෝ වසර 01ට වැඩි කාලයක ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක් සඳහා | 10 |
| | මුළු ලකුණු | 100 |

12-178

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2012** | | | |
| දෙසැම්බර් | 2012.12.07 | සිකුරාදා | 2012.11.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.12.14 | සිකුරාදා | 2012.11.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.12.21 | සිකුරාදා | 2012.12.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.12.28 | සිකුරාදා | 2012.12.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2013** | | | |
| ජනවාරි | 2013.01.04 | සිකුරාදා | 2012.12.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.01.11 | සිකුරාදා | 2012.12.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.01.18 | සිකුරාදා | 2013.01.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.01.24 | බ්‍රහස්පතින්දා | 2013.01.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2012.02.01 | සිකුරාදා | 2012.01.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.02.08 | සිකුරාදා | 2012.01.24 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2012.02.15 | සිකුරාදා | 2012.02.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.02.22 | සිකුරාදා | 2012.02.08 | සිකුරාදා | දහවල් | 12.00 |

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2012 ජුනි මස 23 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.